ශ්‍රී ලංකා විවෘත විශ්වවිද්‍යාලය
අධ්‍යාපන පීඨය
විශේෂ අවශ්‍යතා අධ්‍යාපනය පිළිබඳ අධ්‍යාපනවේදී ගෞරව උපාධි වැඩසටහන
6 වන මට්ටම
අවසාන පරීක්ෂණය - 2025/2026
**SNU6229/SNU6223 – විශේෂ අධ්‍යාපන අවශ්‍යතා සහිත දරුවන්ගේ ළමා අයිතිවාසිකම්**
**කාලය- පැය තුනයි. (03)**

---

**දිනය - 2026.06.28** **වේලාව - පෙ.ව.09.30 - ප.ව.12.30 දක්වා**

---

**1 වන කොටසේ සියලුම ප්‍රශ්නවලට ද, 2 වන කොටසේ ඕනෑම ප්‍රශ්න තුනකට (03) ද පිළිතුරු සපයන්න.**

## 01 වන කොටස

01. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතිය (UNCRC) මගින් පෙන්වා දී ඇති ළමා අයිතිවාසිකම් වල ප්‍රධාන ඛාණ්ඩ හතර (04) නම් කරන්න.

02. බ්‍රිතාන්‍ය යටත් විජිත සමයේ දී ළමයින්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ගනු ලැබූ ක්‍රියාමාර්ග පහක් (05) සඳහන් කරන්න.

03. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් සම්මුතියේ සඳහන් වන "වෙන්කොට නොසැලකීමේ මූලධර්මය" කෙටියෙන් පැහැදිලි කරන්න.

04. ශ්‍රී ලංකාව තුළ අපත්‍යීකරණයේදී සලකා බලනු ලබන අවශ්‍යතා පහක් (05) ලැයිස්තුගත කරන්න.

05. එක්සත් ජාතීන්ගේ ළමා අයිතිවාසිකම් පිළිබඳ සම්මුතියේ පැහැදිලි කර ඇති පරිදි "ජීවත් වීමේ අයිතිය" යන්න කෙටියෙන් පැහැදිලි කර, ළමයින්ගේ එම අයිතිවාසිකම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා රජය විසින් ගෙන ඇති ක්‍රියාමාර්ග තුනක් (03) සඳහන් කරන්න.

06. ශ්‍රී ලංකීය සමාජය තුළ ළමා අපයෝජන ඉහළ යාමට බලපාන සාධක පහක් (05) නම් කරන්න.

07. ආබාධිත තත්ත්වයන් සහිත ළමයින්ගේ අයිතිවාසිකම් උල්ලංඝනය වීමේ වැඩි අවදානමක් පවතින අවස්ථා පහක් (05) ලැයිස්තුගත කරන්න.

08. ජාතික ළමා ආරක්ෂක අධිකාරියේ ප්‍රධාන වගකීම් තුනක් (03) සඳහන් කරමින් එහි කාර්යභාරය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 05x08=40)

## 02 - වන කොටස

09. (i.) "විශේෂ තත්ත්ව යටතේ ස්ථානගත කල දරුවන්" යන යෙදුම පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii.) විශේෂ තත්ත්ව යටතේ ස්ථානගත කල දරුවන්ගේ අයිතිවාසිකම් තහවුරු කිරීමේදී "අන්තර්කරණ අධ්‍යාපනයේ" කාර්යභාරය සාකච්ඡා කරන්න. අදාළ උදාහරණ ඇසුරින් ඔබේ පිළිතුර පැහැදිලි කරන්න. (ලකුණු 07)

(iii.) "ළමා අයිතිවාසිකම් සියලුම දරුවන්ට සමානව සහතික කර ඇතත්, සමාජීය හා ආර්ථික අසමානතාවයන් නිසා ඇතැම් දරුවන්ට ඔවුන්ගේ අයිතිවාසිකම් පූර්ණ වශයෙන් භුක්ති විඳීමට නොහැකිවේ."

විශේෂ තත්ත්වයන් යටතේ ජීවත් වන දරුවන් කෙරෙහි අවධානය යොමු කරමින් ඉහත ප්‍රකාශය විවේචනාත්මකව විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

10. (i.) ළමයින්ගේ වර්ධනයට සහ සංවර්ධනයට බාධා පමුණුවන සාධක දෙකක් **(02)** කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 04)

(ii.) ළමයින්ගේ වර්ධනය හා සංවර්ධනය සඳහා සහයෝගය දැක්වීමේ දී පවුල සතු කාර්යභාරය සාකච්ඡා කරන්න. (ලකුණු 06)

(iii.) "ආබාධිත තත්ත්වයන් සහිත ළමයින්ටද පූර්ණ සංවර්ධනයක් සඳහා අයිතිවාසිකමක් ඇත."

එම දරුවන්ටගේ පූර්ණ සංවර්ධනයට උපකාරී වන අන්තර්කරණ ඉගෙනුම් පරිසරයක් නිර්මාණය කිරීමේදී ගුරුවරුන් සතු කාර්යභාරය විශ්ලේෂණය කරන්න. (ලකුණු 10)

11. (i.) "සහභාගිත්ව අයිතිය" යන්න කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 03)

(ii.) අධික ලෙස දරුවා ආරක්ෂා කිරීම සහ දරුවා පිළිබඳ අවම අපේක්ෂාවන් පැවතීම, ආබාධිත තත්ත්වයන් සහිත දරුවන්ට සමාජගත වීමට සහ ඔවුන්ගේ ක්‍රියාකාරී සහභාගිත්වයට බාධාවක් වන්නේ කෙසේදැයි පරීක්ෂා කරන්න. (ලකුණු 07)

(iii.) ආබාධිත තත්ත්වයන් සහිත දරුවන් සමාජයේ ක්‍රියාකාරී සහ ප්‍රයෝජනවත් සාමාජිකයන් බවට පත් කිරීම සඳහා, පවුල් මගින් ඔවුන්ව සවිබල ගැන්විය හැකි ආකාරය විවේචනාත්මකව සාකච්ඡා කරන්න. (ලකුණු 10)

12. (i.) "සිසුන් අතර ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය ප්‍රවර්ධනය කිරීමේදී, සාම්ප්‍රදායික මාධ්‍යවලට වඩා සමාජ මාධ්‍ය වඩාත් ඵලදායී වේ."

ඔබ මෙම ප්‍රකාශය සමඟ එකඟ වන්නේද? අදාළ හේතු සහ උදාහරණ දක්වමින් ඔබේ පිළිතුර සාධාරණීකරණය කරන්න. (ලකුණු 08)

(ii.) "සාම්ප්‍රදායික දැනුවත් කිරීමේ වැඩසටහන් මගින් සිසුන් කෙරෙහි ඇති කරන බලපෑම සීමිතය."
සිසුන් අතර ළමා අයිතිවාසිකම් පිළිබඳ දැනුවත්භාවය සහ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා භාවිත කළ හැකි, පාසල පාදක කරගත් නව්‍යකරණ ක්‍රියාකාරකම් දෙකක් **(02)** යෝජනා කර පැහැදිලි කරන්න. (ලකුණු 12)

13. (i.) දරුවාගේ උපරිම යහපත ප්‍රධාන වශයෙන් සලකා බැලිය යුතු අවස්ථා තුනක් **(03)** ලැයිස්තුගත කරන්න. (ලකුණු 03)

(ii.) අපයෝජනය සහ නොසලකා හැරීම දරුවන්ගේ සංවර්ධනයට සහ යහපැවැත්මට බලපාන්නේ කෙසේද යන්න සාකච්ඡා කරන්න. (ලකුණු 07)

(iii.) දරුවන්ගේ ආරක්ෂාව සහ යහපැවැත්ම ප්‍රමුඛ හා සහතික කිරීම සඳහා පාසල්වලට, දෙමාපියන් සමඟ කටයුතු කළ යුතු ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 10)

14. (i.) දරුවෙකු නිවස තුළදී නොසලකා හැරීමට ලක්වන බව ඇඟවෙන ලක්ෂණ පහක් **(05)** ලැයිස්තුගත කරන්න. (ලකුණු 05)

(ii.) ගුරුවරයකු ලෙස ඔබ එවැනි සිදුවීමකට ප්‍රතිචාර දැක්වීමේදී ගනු ලබන පියවර පැහැදිලි කරන්න. (ලකුණු 05)

(iii.) නිවස තුළදී දරුවෙකුගේ අයිතිවාසිකම් නොසලකා හැරෙන අවස්ථාවලදී ඒ පිළිබඳව ක්‍රියා කිරීමේදී ගුරුවරයෙකු ලෙස ඔබට මුහුණ දීමට සිදුවිය හැකි අභියෝග දෙකක් **(02)** විස්තර කරන්න. එම එක් එක් අභියෝගය ජය ගැනීම සඳහා ප්‍රායෝගික උපාය මාර්ග යෝජනා කරන්න. (ලකුණු 10)

- සියලුම හිමිකම් ඇවිරිණි. -